## 154 – සමිඳු පුදට පඬුරු රැගෙන

සමිඳු පුදට පඬුරු රැගෙන
පුදසුන වෙත පා නගා
දොහොත් මුදුන් දී සදා
පුදමුව සමිඳා සැම දින බැතිනා

සඳුන් කොකුම් තුවරලා
පහන් වැටි ද දල්වලා
මලින් පලින් ගවසලා
පුදසුන සරසා පුදමුව හිමිපා

අපගේ රටද හිමි සඳේ
ජනතාවද ඔබට වේ
හෙළ පොළොවේ උපන් දෑ
ඔබටම සමිඳේ පිදෙතිය තිබඳේ

අප සිතුවිලි සැම දිනේ
එකමුතුකම සමගිනේ
අපගේ වැඩද පඬුරුවේ
ඔබගේ පුදසුනේ එක ලෙස සමිඳේ

පූපය ඔබේ සිරුරටා
මිදියුෂ ඔබේ රුහිරෙටා
හරවති ඔබ සමිඳුනි
අපද ඔබ වෙතේ හරවනු එලෙසේ